# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk


ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2022.02.15 |

## ශ්‍රී ලංකා ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2022 ජනවාරි

### 2022 ජනවාරි මාසයේදී ද නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක ඉහළ යන ලදී.

**නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 ජනවාරි මාසයේ දී 58.7ක අගයක් වාර්තා කරමින් 2021 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.6කින් ඉහළ යන ලදී.** මේ සඳහා ප්‍රධාන වශයෙන් නව ඇණවුම් සහ නිෂ්පාදන ඉහළ යාමත් සේවා නියුක්තිය යථා තත්ත්වයට පත්වීමත් හේතු විය. තවද, තොග මිල දී ගැනුම් ඉහළ ගිය අතර ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය ද පෙර මාසයට සාපේක්ෂව වැඩි විය.


**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**58.7**

**2021 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.6ක ඉහළ යෑමකි**

විශේෂයෙන් රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශයේ සහ ආහාර හා පාන නිෂ්පාදන අංශයෙහි නව ඇණවුම්, නිෂ්පාදන සහ තොග මිල දී ගැනුම් වල දක්නට ලැබුණු ඉහළ යාම නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ සමස්ත ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය. සේවා නියුක්ති උප දර්ශකය 2022 ජනවාරි මාසයේ දී යහපත් වර්ධනයක් පෙන්නුම් කළ ද රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන අංශය වෙත සේවකයින් ආකර්ෂණය කර ගැනීමේ අපහසුව පිළිබිඹු කරමින් එම අංශයේ සේවා නියුක්ති උප දර්ශකය තවදුරටත් පහළ අගයක පැවතුණි. මේ අතර, නව ඇණවුම් සහ නිෂ්පාදන ඉහළ යාමට සමගාමීව තොග මිළදී ගැනුම් වර්ධනය විය.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | 2021 දෙසැ. | 2022 ජන. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **58.1** | **58.7** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 65.5 | 62.2 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 58.0 | 59.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 48.0 | 55.2 | + | පහළ යෑමක සිට ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 52.0 | 55.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 61.1 | 56.6 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය 2022 ජනවාරි මාසයේ දී පෙර මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය විය. සමීක්ෂණයට ප්‍රතිචාර දක්වන බොහෝ පිරිසක් ආනයන තොග ලැබීමේ ප්‍රමාදයක් අත්විඳි අතර මේ සඳහා නැව් ගත කිරීමේ ලේඛන නිෂ්කාශනය කිරීම හා ණයවර ලිපි විවෘත කිරීම හා සම්බන්ධ බාධා සහ වරායේ තදබදය හේතු විය.

රට තුළ මෙන්ම ගෝලීය ආර්ථික කටයුතු නව දුරටත් වර්ධනය වීමක් අපේක්ෂා කරමින් ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන අංශයෙහි ක්‍රියාකාරකම් සඳහා වන අපේක්ෂාවන් ඉහළ මට්ටමක පවතී.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2022 ජනවාරි මාසයේ දී දර්ශකාංක 1.0කින් පහළ යමින් 53.2ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

පෙර මාසයට සාපේක්ෂව 2022 ජනවාරි මාසයේ දී යුරෝපා කලාපයේ සහ රුසියාවේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වැඩි වේගයකින් ඉහළ යන ලදී. තවද, එක්සත් ජනපදයෙහි, එක්සත් රාජධානියෙහි, ඉන්දියාවේ සහ සිංගප්පූරුවේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක 2022 ජනවාරි මාසයේ දී අඩු වේගයකින් ඉහළ යන ලදී. එසේ වුව ද, ජනවාරි මාසයේ චීනයේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය පෙර මාසටය සාපේක්ෂව අඩු විය.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2022 පෙබරවාරි 14 වන දිනට*

[1] *මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

**සේවා අංශයේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරමින් සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2022 වසර ආරම්භයේ දී 57.5ක දර්ශක අගයක් වාර්තා කළේය.** මෙම ඉහළ යෑම සඳහා නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම්, සේවා නියුක්තිය සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම් යන උප දර්ශකවල ඉහළ යෑම් හේතු විය.

ප්‍රධාන වශයෙන්, ප්‍රවාහන, වෘත්තීය සේවා, අනෙකුත් පෞද්ගලික සේවා සහ අධ්‍යාපන යන උප අංශවල දක්නට ලැබුණු වර්ධනයන් සමඟ, 2021 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2022 ජනවාරි මාසයේ දී නව ව්‍යාපාර තවදුරටත් ඉහළ ගියේය.


කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත සීමා අඛණ්ඩව ලිහිල්ව පැවතීම තුළ, 2022 ජනවාරි මාසයේ දී ව්‍යාපාර ක්‍රියාකාරකම්, 2021 දෙසැම්බර් මාසයට සාපේක්ෂව අඩු වේගයකින් වුවද වර්ධනය වීමක් වාර්තා කළේය. මෙහිදී, ප්‍රවාහන සහ වෘත්තීය සේවා යන උප අංශවල සැලකිය යුතු වර්ධනයන් වාර්තා විය. තවද, සංචාරක පැමිණීම් ඉහළ යෑම හේතුවෙන් නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා උප අංශයේ ව්‍යාපාර ක්‍රියාකාරකම් ද තවදුරටත් වර්ධනයන් වාර්තා කළේය. මේ අතර, මූල්‍ය සේවා, අනෙකුත් පෞද්ගලික සේවා සහ අධ්‍යාපන උප අංශවලට අදාළ ව්‍යාපාරික ක්‍රියාකාරකම් ද ජනවාරි මාසය තුළ ඉහළ ගියේය.

ව්‍යාපාර ක්‍රියාකාරකම්වල ඉහළ යෑමට සමගාමීව සමාගම් විසින් අඛණ්ඩව නව බඳවා ගැනීම් සිදු කිරීම හේතුවෙන් 2022 ජනවාරි මාසයේ දී සේවා නියුක්තිය නොකඩවා තෙවන මාසයටත් ඉහළ ගියේය. මේ අතර, කාර්ය මණ්ඩල සේවකයන් සාමාන්‍ය පරිදි සේවයට වාර්තා කිරීම හේතුවෙන් ජනවාරි මාසයේ දී නිමකිරීමට නියමිත කාර්යයන් අඛණ්ඩව පහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**57.5**

**2021 දෙසැම්බර් මාසයට සාපේක්ෂව දර්ශකාංක 4.9ක පහළ යෑමකි.**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | 2021 දෙසැ. | 2022 ජන. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **62.4** | **57.5** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ව්‍යාපාර | 67.8 | 57.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 72.8 | 62.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 53.0 | 52.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 45.7 | 47.4 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 72.8 | 68.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඔමික්‍රෝන් අසාදිත රෝගීන් සංඛ්‍යාව ඉහළ ගියද කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත සීමා තවදුරටත් ලිහිල්ව පැවතීම තුළ, ව්‍යාපාර කටයුතු වර්ධනය වීම පිළිබඳ සුබවාදී අදහස් හේතුවෙන් ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් ජනවාරි මාසයේ දී තවදුරටත් වර්ධනය විය. එසේ වුවද, සමහර ප්‍රතිචාර දක්වන්නන් විසින් ආනයන සම්බන්ධ සීමා කිරීම් සහ උද්ධමන පීඩනය හේතුවෙන් ව්‍යාපාර ක්‍රියාකාරකම් කෙරෙහි ඇති වන සෘණාත්මක බලපෑම පිළිබඳව නිරන්තරයෙන් සඳහන් කරනු ලබයි.

## ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි සාපේක්ෂව අඩු වර්ධනයක් පෙන්නුම් කරමින්, ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2021 දෙසැම්බර් මාසයේ පැවති 54.7 සිට 2022 ජනවාරි මාසයේ දී 51.3ක් වාර්තා කළේය.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ඉන්දියාව සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2022 ජනවාරි මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ජපානයේ එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2022 පෙබරවාරි 14 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.